15
පාඩම

# නරක සිතුවිලි

## අකුසල රාශිය - චෛතසික 14

අකුසල් සිත් දොළොස ඇසුරුකරමින් උපදින චෛතසික තුදුස (14) කි. ඒවා අකුසල රාශිය යටතේ විස්තර වේ. මේවාට අකුසල චෛතසික යන නම ද භාවිත වේ.

> මොහො අහිරිකං අනොත්තප්පං උද්ධච්චං ලොභො දිට්ඨි මානො දොසො ඉස්සා මච්ඡරියං කුක්කුච්චං ථීනං මිද්ධං විචිකිච්ඡා චෙති චුද්දසිමෙ චෙතසිකා අකුසලා නාම

## අකුසල චෛතසික 14

| | | | | |
|---|---|---|---|---|
| 1. මෝහ | 2. අහිරික | 3. අනොත්තප්ප | 4. උද්ධච්ච | 5. ලෝභ |
| 6. දිට්ඨි | 7. මාන | 8. දෝස | 9. ඉස්සා | 10. මච්ඡරිය |
| 11. කුක්කුච්ච | 12. ථීන | 13. මිද්ධ | 14. විචිකිච්ඡා | |

### 1. මෝහ

ආරම්මණෙ මුය්හතීති මොහො අඤ්ඤාණං

සිතෙහි අරමුණුවල සැබෑ තත්ත්වය මුවහ කරන ස්වභාවය මෝහය යි. නොදැනීමයි. ඇසෙහි පටලය මෙනි. නිල් කණ්ණාඩියක් දැමුවා සේ මෝහය අපව නොමග යවයි. මෙය බලවත් අකුසල ධර්මයකි. පටිච්චසමුප්පාදයෙහි දී අවිජ්ජා යනුවෙන් හැඳින්වූයේ ද මෙය යි. මෝහය දොළොස් අකුසල් සිත්හි යෙදෙන්නේ ය.

### 2. අහිරික

කාය දුච්චාරිතාදිතො අජිගුච්ඡන ලක්ඛණං අහිරිකං

කාය දුශ්චරිතාදිය පිළිකුල් නොකරන ස්වභාවයයි. ඌරා අසුචිවලට මෙන් පවට ඉතා කැමැතිවීම අහිරිකය යි. ප්‍රසිද්ධියේ පව්කරන්නේ ඒ ලැජ්ජාව නැති නිසා ය. මෙම චෛතසිකය ද දොළොස් අකුසල සිත්වල යෙදේ.

### 3. අනොත්තප්ප

කාය දුච්චාරිතාදීහි අසාරජ්ජ ලක්ඛණං අනුත්තාස ලක්ඛණං වා

පව්කිරීමට ඇති බිය ඔත්තප්පය යි. කාය දුශ්චරිතාදී පව් කිරීමට බියක් නොමැතිකම තැතිගැන්මක් නොමැතිකම අනොත්තප්පය යි. පලගැටියා ගින්නට බියක් නොදක්වන්නාක් මෙන් මෙම චෛතසිකය නිසා පව් කිරීමට බියක් නොදක්වයි. මෙම සිත ද දොළොස් අකුසල සිත්වල යෙදේ.

### 4. උද්ධච්ච

උද්ධතස්ස භාවො උද්ධච්චං, තං චිත්තස්ස අවූපසම ලක්ඛණං

සිතෙහි නොසන්සුන් භාවය උද්ධච්චය යි. අළුගොඩකට ගලකින් ගැසූ කල මෙන් ද සුළඟින් සෙලවෙන ධජයක් මෙන් ද උද්ධච්චයෙන් යුතු සිත නිතර චංචල ව විසිරී පවතී. සිතෙහි තැන්පත් ස්වභාවය නැතිවන්නේ මෙම චෛතසිකයෙනි. මෙය ද දොළොස් අකුසල සිත්වල යෙදේ.

### 5. ලෝභ

ලුබ්භතීති ලොභො, සො ආරම්මණෙ අභිනිවෙස ලක්ඛණො

ආශාව, ඇලීම, ගිජුකම ලෝභය යි. අරමුණෙහි ඇලෙන බැඳෙන ස්වභාවය ලෝභය යි. අළුත් වස්ත්‍රයක දැලි, තෙල් ආදිය ඉක්මනින් ඇලෙන්නාක් මෙන් සිතෙහි ලෝභ චෛතසිකය අරමුණෙහි සිත අලවන්නේ ය. මෙය ලෝභ මූලික සිත් අටෙහි පමණක් යෙදේ.

### 6. දිට්ඨි

ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති මිච්ඡාභිනිවෙස ලක්ඛණා දිට්ඨි

තමා පිළිගත් දෙය ම සත්‍ය ය අන් දේ අසත්‍ය ය. යනුවෙන් අරමුණ වරදවා දකින ස්වභාවය දිට්ඨිය යි. වැරදි නිගමනවලට බැසීම යි. මිරිඟුව ජලය සේ පෙනෙන්නාක් මෙන් දිට්ඨිය සිත නොමග යවයි. මෙම චෛතසිකය ලෝභ මූලික දිට්ඨිගත සම්පයුක්ත සිත් සතරෙහි පමණක් යෙදේ.

### 7. මාන

සෙය්‍යොහමස්මීත්‍යාදිනා මඤ්ඤතීති මානො

මාන යනු මැනීම යි. අනුන් හා තමා සංසන්දනය කරමින් මැනීම යි. ''මම උසස්මි'' යනාදී වශයෙන් මැනීම හෙවත් සිතෙහි උඩඟු ස්වභාවය යි. මෙම මානය සෙය්‍යමාන (තමා

උසස් ය), සදිසමාන (තමා සමාන ය) හීනමාන (තමා පහත් ය) යනුවෙන් තෙයාකාර ය. මෙම චෛතසිකය දොළොස් අකුසල් සිත් අතරෙන් දිට්ඨිගතවිප්පයුත්ත සිත් සතරෙහි පමණක් යෙදේ.

**8. දෝසො**

දුස්සතීති දොසො. සො චණ්ඩික්ක ලක්ඛණො, පහටාසිවිසො විය

සිත දූෂණය කරවන්නේ ද්වේශය යි. දණ්ඩෙන් පහර කෑ නයෙකු මෙන් අනිටු අරමුණෙහි කෝපවන, සැඩපරුෂ වන ලක්‍ෂණය ද්වේශය යි. ක්‍රෝධය, තරහ, කේන්තිය යනාදී වචනවලින් හැඳින්වෙන්නේ ද මෙය යි. මෙය ද අකුසල චෛතසිකයකි. දෝමනස්ස සහගත පටිඝ සම්පයුත්ත සිත් දෙකෙහි පමණක් මෙය යෙදේ.

**9. ඉස්සා**

ඉස්සතීති ඉස්සා. පරසම්පත්තිං උසූයනලක්ඛණා

අනුන්ගේ සම්පත් නො ඉවසන ස්වභාවය යි. අනුන්ගේ සැපතට ඊර්ෂ්‍යා කරන ස්වභාවය යි. මෙය ද අකුසල චෛතසිකයකි.

**10. මච්ඡරිය**

අත්තනො සම්පත්තිං නිගුහනලක්ඛණං

මච්ඡරිය නම් මසුරුකම යි. තමාගේ සම්පත් සඟවන ස්වභාවය යි. මෙය ලෝභයට වඩා බලවත් ය. අනුන්ට තම සම්පත් දෙනවා තබා දකිනවාට වත් කැමති නැති ස්වභාවය යි. මසුරුකම ඇත්තා තමන් භුක්ති විඳින්නේත් නැත. අනුන්ට විඳින්නට දෙන්නේත් නැත.

**11. කුක්කුච්ච**

කතාකත දුච්චරිත සුචරිතානුසොචනලක්ඛණං

විපිළිසර බව යි. කළ දුසිරිත් සහ නොකළ සුසිරිත් පිළිබඳ පසුතැවෙන බව යි. මෙය උද්ධච්චය හා සමව යන්නකි. මේ දෙක එක්ව නීවරණයක් වශයෙන් කුසල් සිත ආවරණය කරයි. ඉහත දැක්වූ දෝස, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච යන චෛතසික දෝස මූලික පටිඝසම්පයුත්ත සිත් දෙකෙහි පමණක් යෙදේ. අන් තැන නොයෙදේ.

## 12. ථීන

**අනුසසාහනාව සංසිදන වසෙන සංගතභාවො**

සිතෙහි දුබල බව චිත්ත වේගයේ හීන බව, මැළි බව, පසුබස්නා ස්වභාවය, සිතෙහි ඇතිවන අලස බව ථීන නම් වේ.

## 13. මිද්ධ

**විගත සාමත්‍ථියතා, ආසත්ති විසාතො වා**

චෛතසිකයන්ගේ අලස බව මින් අදහස් කෙරේ. මෙයින් සිත හැකිලේ. උත්සාහය හීන වේ. සමහරවිට නිදිමත ඇති වේ. අභිධර්මයේ දී ථීන හා මිද්ධ දෙක චෛතසික දෙකක් ලෙස වෙන වෙන ම යෙදුණ ද, සූත්‍ර ධර්මවල දී ථීන හා මිද්ධය එකක් ලෙස එනම් ථීනමිද්ධ නීවරණය ලෙස විග්‍රහ වේ.

## 14. විචිකිච්ඡා

**සභාවං විචිනනෙතා තාය කිච්ඡති කිලමතීති විචිකිච්ඡා**

විචිකිච්ඡා නම් සැකය යි. ඕනෑම දෙයක ස්වභාවය නියම තත්ත්වය නිගමනය කරගත නොහැකිව කුතුහලයෙන් සොය සොයා විමසීමයි. මෙම චෛතසිකය උපෙක්ඛා සහගත විචිකිච්ඡා සම්පයුක්ත සිතෙහි පමණක් යෙදේ. මෙය ශ්‍රද්ධාවට හා ඥානයට විරුද්ධ චෛතසිකයකි.

**අභ්‍යාස**

01. අකුසල චෛතසික කීය ද? ඒ මොනවා ද? මතකයෙන් ලියන්න.
02. අකුසල් චෛතසිකවලින් යුත් සිතක ස්වභාවය පැහැදිලි කරන්න.